## ස්ථාවර නියෝග 27/2 යටතේ නගනු ලබන ප්‍රශ්නය - 2023.08.22

**ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සතු අයි නාලිකාවේ ගුවන් කාලය නීති විරෝධී ලෙස පෞද්ගලික සමාගමකට බදු දීමට උත්සාහ ගැනීම ආශ්‍රිතව මතු වී ඇති ගැටලුකාරී තත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.**

ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සතු අයි නාලිකාව (EYE Channel) හෝ එම නාලිකාවට අයත් ගුවන් කාලය, එස්.බී.සී. ටීවී (SBC TV) නාලිකාව විකාශනය කරන විස් බ්‍රෝඩ්කාස්ටින් පුද්ගලික සමාගමට (VIS Broadcasting Private Limited) මාස 06 කාලයක් බදු දීමට කටයුතු කර ඇති බව පසුගියදා වාර්තා වුණා. මෙම බදු දීමේ තීරණය ගෙන තිබෙන්නේ රූපවාහිනී සංස්ථා අධ්‍යක්ෂ මණ්ඩලය විසිනුයි. විශේෂයෙන් රූපවාහිනී නාලිකාවන් විසින් විකාශන කටයුතු සඳහා පාවිච්චි කරනු ලබන ගුවන්විදුලි සංඛ්‍යාතද සහිත ගුවන් කාලය මහජන දේපළක් වන බැවින් එම මහජන දේපළ අයිතිය අත්හැරීම සම්බන්ධ තීන්දු ගැනීමට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට බලය තිබේද යන්න ගැටලු සහගතයි.

එසේම රූපවාහිනී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නීති විරෝධීව සිදු කළ මෙම මාස 06ක බදු දීම සඳහා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය පසුව ලබා ගැනීමටද ඊට අමතරව කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතිව අයි නාලිකාව තවත් වසර 02ක කාලයකට බදු දීමටද උත්සාහ දරන ලද බව අනාවරණය වී තිබෙනවා. මෙම යෝජනා සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය විසින් අවසාන වශයෙන් ගන්නා ලද තීරණය නිල වශයෙන් මෙතෙක් ප්‍රකාශයට පත් වී නැහැ. ජනතාව සතු දේපළ සම්බන්ධයෙන් මෙසේ වගකීම් විරහිත ලෙස හැසිරීම කිසිසේත් අනුමත කළ නොහැකියි.

මේ තත්වය තුළ පැන නගින පහත ගැටලුවලට පිළිතුරු අදාළ අමාත්‍යවරයා විසින් සභාව හමුවේ තබනු ඇතැයි අපේක්ෂා කරනවා.

01. රූපවාහිනී සංස්ථාව සතු අයි නාලිකාවට අයත් ගුවන් කාලය මාස 06ක කාලයක් සඳහා පෞද්ගලික සමාගමකට බදු දෙනු ලැබ තිබේද? එවැනි පැවරීමකට අදාළව කටයුතු කිරීමට රූපවාහිනී සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලයට බලයක් තිබේද? අදාළ අමාත්‍යවරයා විසින් එවැනි අනීතික පැවරීමකට උපදෙස් දෙනු ලැබුවේද?

02. අයි නාලිකා ගුවන් කාලය බදු දීමට අදාළව බදු ගිවිසුමක් අත්සන් කරන ලද්දේද? එසේනම් අදාළ බදු ගිවිසුමට අත්සන් තබන ලද්දේ කවුරුන් විසින්ද? අත්සන් තැබීම සිදු වූයේ කවදාද? ඒ පැවරීම වෙනුවෙන් සංස්ථාව කොපමණ මුදලක් ලැබුවේද?

03. එම බදු පැවරීම සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය විසින් ගන්නා ලද තීරණය කවරේද? එම බදු පැවරීමේ වත්මන් තත්වය කවරේද? ගනුදෙනු වූ මුදල්වලට කුමක් සිදු වී ඇත්ද?

**අනුර දිසානායක**

පාර්ලිමේන්තු මන්ත්‍රී

2023.08.21